THE FINANCE HOUSES ASSOCIATION OF SRI LANKA
(Incorporated under the Companies Act 7 of 2007)
Regd. No G.A. 10

60th ANNIVERSARY 1958 - 2018

No.150/3, Ward Place,
Colombo 07.
finass@sltnet.lk
www.fhalanka.lk
011 2670335

# ත්‍රී රෝද රථ සංගමයේ සභාපති සුනිල් ජයවර්ධන මහතාගේ සාතනය ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා හෙළා දකී

**2020 ජුනි 12, කොළඹ**

ශ්‍රී ලංකාවේ ලියාපදිංචි මූල්‍ය සමාගම් 41 ක එකතුවකින් සැදුම්ලත් ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා (FHA) පසුගියදා සිදු වුණු, ශ්‍රී ලංකා ස්වයං රැකියා ත්‍රී රෝද රථ සංගමයේ සභාපති, සුනිල් ජයවර්ධන මහතාගේ සාතනය තරයේ හෙළා දකියි.

සුනිල් ජයවර්ධන මහතාගේ මෙම සාතනය වංචනික මූල්‍ය ආයතන විසින් අනුගමනය කරනු ලබන සදාචාර විරෝධී ක්‍රියාවන්ට උදාහරණයක් වන අතර, සිද්ධියට සම්බන්ධ, නීති විරෝධී මූල්‍ය ආයතනයක් වන Chanmil Investment (Pvt) Ltd, ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි නොවූ ආයතනයකි. එමෙන්ම, එම ආයතනය ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි මූල්‍ය සමාගම් 41 සමග කිසිදු සම්බන්ධතාවක් නොපවත්වන අතර, ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා (FHA) වෙත කිසිදු අයුරකින් හෝ අනුයුක්ත කර නොමැත.

එනිසා, මෙම වංචනික මූල්‍ය ආයතනය විසින් සිදු කරන ලද ක්‍රියාව හා ඒ හේතුවෙන් ඇති වූ ඛේදනීය තත්ත්වය, ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා විසින් තරයේ හෙළා දකිනු ලබයි.

ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා යනු, රට තුළ මූල්‍ය තැන්පතු සහ ණය දෙන සමාගම් කිසිදු නියාමනයකින් තොරව ක්‍රියාත්මක වීමේදී මතු වුණු ගැටලු විසඳීමේ අරමුණින් පිහිටුවා ගැනුණු, ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත ලියාපදිංචි මූල්‍ය සමාගම් 41 කින් සමන්විත, ක්ෂේත්‍රයේ දීර්ඝ කාලීන නමක් දිනා ගත් සංගමයකි. 'මූල්‍ය ආයතන' යැයි කියා ගත් බොහෝ වංචනික ආයතන විසින් අනුගමනය කරන ලද සදාචාර විරෝධී ක්‍රියාවන් නැවැත්වීමට එමගින් හඬක් නැගිණි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද 2020 අංක 04 හා 05 දරන චක්‍රලේඛයට අනුව, COVID-19 වසංගතය සහ ගෝලීය අර්බුදය සමග ඇති වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සාමාන්‍ය ජනතාව මුහුණ පා සිටින ණය බර හමුවේ සහන සලසමින්, ණය පමා සහන කාලයක් ක්‍රියාත්මක කරන ලෙස මූල්‍ය සමාගම් වෙත උපදෙස් දෙනු ලැබිණි. ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා හා අනුබද්ධ ලියාපදිංචි මූල්‍ය සමාගම් 41 ම, රජය විසින් නියම කර ඇති මෙම ණය පමා සහන කාලය ක්‍රියාත්මක කරන බව එම සංගමය තවදුරටත් පැහැදිලි කරයි.

එමෙන්ම, රජය විසින් මෙලෙස ණය පමා සහන කාල සීමාවක් පනවද්දී, බලපත්‍රලාභී මූල්‍ය සමාගම් විසින් දිවයින පුරා 500,000 කට ආසන්න ගැනුම්කරුවන් පිරිසකට එම සහනය පිරි නමා තිබේ. එවැනි තත්ත්වයක් යටතේ, වටිනා මිනිස් ජීවිත අහිමි වීමට මග පාදමින්, කිසිදු නියාමනයකින් තොර, බලපත්‍ර නොමැති මූල්‍ය ආයතන විසින් ගෙන යන මෙවැනි විනාශකාරී ක්‍රියා තම සංගමය විසින් හෙළා දකින බව ද ෆිනෑන්ස් හවුස් ඇසෝෂියේෂන් ඔෆ් ශ්‍රී ලංකා තරයේ අවධාරණය කර සිටී.